# ශාසනාවතරණය

මහාචාර්ය

## රේරුකානේ චන්දවිමල

(සාහිත්‍ය චක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද,
අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණී)
මහානායක ස්වාමිපාදයන් වහන්සේ විසින්
සම්පාදිතයි.

රේරුකානේ චන්දවිමල මහනායක හිමියන් විසින් රචිත **ශාසනාවතරණය** නමැති පොතෙන් "ස්ත්‍රීන් හා සබඳකම් පැවැත්වීම" යන මාතෘකාව යටතේ ලියවී තිබුනු පිටු අංක **211** සිට **216** දක්වා පිටු පිටපත් කර ධම්ම දානයක් ලෙසට මෙසේ ඉදිරිපත් කරණ ලදී. - **dhammikaweb**

## ස්ත්‍රීන් හා සබඳකම් පැවැත්වීම

පැවිද්දන්ට ඉතා ම හිතවත් පිරිස ඉතා ම උපකාරක පිරිස උපාසිකා පිරිස ය. ඔවුන් ගේ උපකාරය නැති නම් පැවිද්දන්ට මේ බුදුසසුන පවත්වා ගෙන යෑමට ද අපහසු ය. එහෙත් පැවිද්දන් ගේ විනාශයටත් නොයෙක් විට හේතු වන්නේ ස්ත්‍රිය ම ය. මේ සසුනෙහි ස්ත්‍රීන් නිසා පරිහාණියට පත් වූ පැවිද්දෝ බොහෝ ය. සාමාන්‍ය පැවිද්දන් තබා ධ්‍යාන ලබා අහසින් යමින් සිටි ඇතැම් පැවිද්දෝ ද ස්ත්‍රීන් නිසා පරිහාණියට පත්වූහ. එ බැවින් පැවිද්දන් විසින් ස්ත්‍රීන් භජනය කිරීම ඉතා පරෙස්සමෙන් කළ යුතු ය. පැවිද්දන් හට මේ උපකාරක ස්ත්‍රී වර්ජනයත් නො කළ හැකි ය.

ඇය හා සම්බන්ධකම් පැවැත්වීමත් බරපතළ කරුණෙකි. එබැවින් තථාගතයන් වහන්සේ පිරිනිවීමට සමීප කාලයේ දී ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස; අපි ස්ත්‍රිය කෙරෙහි කෙසේ පිළිපදින්නමෝ ද" යි විචාළහ. තථාගතයන් වහන්සේ "**අදස්සනං ආනන්ද**" යනුවෙන් "ආනන්දය, තොපට ස්ත්‍රිය නො දැකීම යහපතැ"යි වදාළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ස්ත්‍රිය දක්නට ලැබෙනවා නම් කෙසේ පිළිපදින්නමෝද", යි විචාළහ. තථාගතයන් වහන්සේ "**අනාලාපෝ ආනන්ද**" යනුවෙන් "ආනන්දය, දුටහොත් කථා නො කිරීම තොපට යහපතැ" යි වදාළ සේක. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ස්ත්‍රිය කථා කළ හොත් කෙසේ පිළිපදින්නෙමුද" යි අනඳ හිමියෝ විචාළහ. එකල්හි තථාගතයන් වහන්සේ "**සති ආනන්ද උපට්ඨපේතබ්බා**" යනුවෙන් සිහිය පිහිටුවා ගත යුතු යයි වදාළ සේක. සිහිය පිහිටවා ගැනීමය යි කියනුයේ -

> "**ඒථ තුම්හේ භික්ඛවෙ, මාතුමත්තීසු මාතුචිත්තං උපට්ඨපේථ, භගිනිමත්තීසු භගිනිචිත්තං උපට්ඨපේථ, ධීතුමත්තීසු ධීතුචිත්තං උපට්ඨපේථ.**"

යන අවවාද පරිදි මවු තරමේ ස්ත්‍රියක හා කථා කරන කල්හි මවක යන සිත තබා ගෙන ද, නැඟණියක තරමේ ස්ත්‍රියක් හා කථා කරන කල්හි නැඟණියක යන සිත තබා ගෙන ද, දුවක පමණ ස්ත්‍රියක හා කථා කරන කල්හි දුවක යන සිත තබා ගෙන ද කථා කිරීම ය. සිහියෙන් තොර ව පමණට වඩා ස්ත්‍රීන් ආශ්‍රය කිරීමෙන් විය හැකි විපතෙහි බරපතල බව මේ කථාවෙන් දත හැකි ය.

පෙර සැවැත් නුවර මව ද පුතා ද වන භික්ෂුණියක් හා භික්ෂුවක් වස් එළඹුණහ. ඒ දෙදෙන නිතර ඔවුනොවුන් දක්නට කැමැත්තෝ වූහ. මව් නිතර පුතා දක්නට යන්නට ද පුතා නිතර මව දක්නට යන්නට ද පුරුදු වූහ. ක්‍රමයෙන් ඒ දෙදෙනා අතර සම්බන්ධය වැඩි විය. එයින් අන්‍යෝන්‍ය විශ්වාසය වැඩි විය.. කල් යෑමෙන් පුතාට මේ මාගේ මවය යන හැඟීම නැති විය. මවට ද මේ මාගේ පුතාය යන හැඟීම නැති විය. අන්තිමට අසද්ධර්ම ප්‍රතිසේවනයෙන් ඒ දෙදෙනා ම පැවිද්දෙන් පිරිහුණෝ ය. ඒ

කාරණය භික්ෂූහු දැන තථාගතයන් වහන්සේට සැලකළෝ ය. එකල්හි බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

"නාහං භික්ඛවේ, අඤ්ඤං ඒකරූපම්පි සමනුපස්සාමි, ඒවං රජනීයං ඒවං කමනීයං ඒවං මදනීයං එවං බන්ධනීයං එවං මුච්ඡනීයං ඒවං අන්තරායකරං අනුත්තරස්ස යෝගක්ඛෙමස්ස අධිගමාය. යථයිදං භික්ඛවෙ, ඉත්ථිරූපං. ඉත්ථිරූපේ භික්ඛවේ, සත්තා රත්තා ගථිතා ගිද්ධා මුච්ඡිතා අජ්ඣෝපන්නා තේ දීඝරත්තං සෝචන්ති ඉත්ථිරූපවසානුගා.

නාහං භික්ඛවේ, අඤ්ඤං ඒකසද්දම්පි -පෙ- ඒකගන්ධම්පි -පෙ- ඒකරසම්පි -පෙ- ඒකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි, යං ඒවං රජනීයං ඒවං කමනීයං ඒවං මදනීයං ඒවං බන්ධනීයං ඒවං මුච්ඡනීයං ඒවං අන්තරායකරං අනුත්තරස්ස යෝගක්ඛෙමස්ස අධිගමාය, යථයිදං භික්ඛවෙ, ඉත්ථි ඵොට්ඨබ්බෝ. ඉත්ථි ඵොට්ඨබ්බෙ භික්ඛවෙ, සත්තා රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣෝපන්නා. තේ දීඝරත්තං සෝචන්ති ඉත්ථි ඵොට්ඨබ්බවසානුගා.

ඉත්ථි භික්ඛවේ, ගච්ඡන්තීපි පුරිසස්ස චිත්තං පරියාදය තිට්ඨති. ඨිතාපි නිසින්නාපි සයානාපි හසන්තීපි භණන්තීපි ගායන්තීපි රෝදන්තීපි උග්ඝාති තාපි, මාතාපි පුරිසස්ස චිත්තං පරියාදය තිට්ඨති. යං හි තං භික්ඛවේ, සම්මා වද-මානෝ වදෙය්‍ය සමන්තපාසෝ මාරස්සාති මාතුගාමං. ඒවං සම්මා වදමානෝ වදෙය්‍ය සමන්තපාසො මාරස්සාති."

(අංගුත්තර පඤ්චක නීවරණ වග්ග)

මෙහි අදහස මෙසේය:

"මහණෙනි, ස්ත්‍රී රූපය තරම් පුරුෂයන් ගේ සිත් ඇලුම් කරන බැඳෙන මත් කරවන ගොඩ එනු නො හැකි ලෙස එරෙන අනිකක් මම නො දනිමි. මහණෙනි, ස්ත්‍රීරූපයට වසඟ වූ එහි ඇලුණා වූ බැඳුණා වූ එරුණා වූ සත්ත්වයෝ දීර්ඝ කාලයක් ශෝක කරන්නාහ.

මහණෙනි, ස්ත්‍රී ශබ්ද -පෙ- ස්ත්‍රී ගන්ධය -පෙ- ස්ත්‍රී රසය -පෙ- ස්ත්‍රී ස්පෘෂ්ටව්‍යය තරම් පුරුෂන්ගේ සිත් ඇලුම් කරන

බැඳෙන මත් කරවන ගොඩ එනු නො හැකිසේ එරෙන අන් එක් දෙයකුදු මම නො දකිමි. මහණෙනි, ස්ත්‍රී ස්ප්‍රෂ්ටව්‍යයට වසඟ වූ එහි ඇලුණා වූ බැඳුණා වූ එරුණා වූ සත්ත්වයෝ බොහෝ කල් ශෝක කරන්නාහ.

මහණෙනි, ස්ත්‍රී යන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නීය. සිටින්නී ද පුරුෂයාගේ සිත් ගන්නී ය. හිඳින්නී ද පුරුෂයාගේ සිත් ගන්නී ය. නිදන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නීය. සිනහ වන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නී ය. කථා කරන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නී ය. ගායනය කරන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නී ය. හඬන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නී ය. මළ ද පුරුෂයා ගේ සිත් ගන්නී ය. මහණෙනි, මාරයා ගේ තොණ්ඩුව" ය යි කිය යුත්තේ ස්ත්‍රියට ය.

ස්ත්‍රිය මෙසේ වන බැවින් ඔවුන් ඇසුරු කරන පැවිද්දන් ඉතා පරෙස්සමෙන් එය කළ යුතු ය. ඇතැම් නවක පැවිද්දෝ වරදක් කරන්නේ නැති නම් ස්ත්‍රියක හා කථා කළාට ස්ත්‍රියකට යමක් දුන්නාට ඇගෙන් යමක් ගත්තාට ඇති වරද කුමක්ද" යි කියමින් ස්ත්‍රීන් හා ආශ්‍රයට පැමිණෙති. ඔවුන් මුලින් එසේ කරන්නේ යම් කිසි අනාගත බලාපොරොත්තුවක් ඇති ව නො ව හුදු විනෝදය පිණිස ය. එහෙත් එසේ කර ගෙන යන ඒ පැවිද්දන් තුළ ඔවුන්ට නො දැනීම කාමරාගය හට ගනී. ඔවුන්ට නො දැනීම ක්‍රමයෙන් එය මෝරයි.

"කාමච්ඡන්දනීවරණා භික්ඛවේ, අන්ධකරණං අචක්ඛු-
කරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරෝධියං විඝාතපක්ඛියං
අනිබ්බාන සංවත්තනිකං"

(බොජ්ඣංග සංයුත්ත)

යනුවෙන් "මහණෙනි, කාමච්ඡන්දය සත්ත්වයා අන්ධ කරන්නක්ය, නුවණැස ඇති නො කරන්නක් ය, මෝඩ කරන්නක්ය, නුවණ නැති කරන්නක් ය, දුකට පක්ෂ වූවක්ය, නිවන් පිණිස නො පවත්නකැ" යි වදාරා ඇති පරිදි කාමච්ඡන්දය මෝරූ කල්හි එයින් ඒ පැවිද්ද අන්ධ වේ. අනාගතයේදී තමාට විය හැකි නපුර ඔහුට නො පෙනෙන්නේ ය. අන්ධභාවය නිසා ආචාර්යෝපාධ්‍යායයන් කරන අවවාදානුශාසනා ඔහුට නො වැටහෙන්නේ ය. අන්‍ය

හිතවතුන් කරන අවවාදානුශාසනා ඔහුට නො වැටහෙන්නේ ය. අවවාද කරන තැනැත්තා සතුරකු ලෙස ඔහුට පෙනෙන්නට වන්නේ ය. එබඳු අය නොයෙක් විට ශාසන ප්‍රතිපත්තියෙන් පිරිහී සිවුරු හැර ගොස් තමන් බලාපොරොත්තු වූ කරුණුත් සිදු කර ගන්නට නො ලැබී මහත් දුකට පත් වෙති. ඔවුනට කාරණය වැටහෙන්නේ සියල්ල සිදු වී අවසන් වූ පසුවය. ස්ත්‍රීන් ඇසුරු කිරීම භයානක බැවින් තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක.

සල්ලපේ අසිහත්ථෙන පිසාචේන පි සල්ලපේ.
ආසිවිසම්පි ආසීදේ යේන දට්ඨෝ න ජීවති.
නත්වේව ඒකෝ ඒකාය මාතුගාමේන සල්ලපේ.
මුට්ඨස්සතිං තා බන්ධති පෙක්ඛිතේන සිතේන ච

(අංගුත්තර පඤ්චක නිපාත)

තේරුම:

හිස සිඳිනු පිණිස කඩුවක් අතෙහි ඇති ව ඉන්නහු හා කථා කරන්නේ ය. කන්නට ආ යකු සමඟ ද කථා කරන්නේය. දෂ්ට කළහොත් ජීවත් නොවන සර්පයා හා ද ගැටෙන්නේ ය. තනි වූ මාගමක් හා තනි ව කථා නො කරන්නේ ය. සිහි මුළා වූ පුරුෂයා බැල්මෙන් හා සිනාවෙන් ඇ බැඳ ගන්නී ය.

**පාරාපරිය මහරහතන් වහන්සේ ද මෙසේ වදාළහ.**

"ඉත්ථිරූපේ ඉත්ථිසරේ පොට්ඨබ්බේපි ච ඉත්ථියා,
ඉත්ථිගන්ධෙසු සාරත්තෝ විවිධං වින්දතේ දුඛං"
ඉත්ථිසෝතානි සබ්බානි සන්දන්ති පඤ්ච පඤ්චසු
තේසමාවරණං කාතුං යෝ සක්කෝති විරියවා,
සෝ අත්ථවා සෝ ධම්මට්ඨෝ සෝ දක්ඛෝ සෝ
විචක්ඛණෝ.

ස්ත්‍රී රූපයෙහි ද ස්ත්‍රී ශබ්දයෙහි ද ස්ත්‍රී ස්ප්‍රශ්ටව්‍යයෙහි ද ස්ත්‍රී ගන්ධයෙහි ද ඇලුණාහු අනේකප්‍රකාර දුක් විඳින්නාහ. ස්ත්‍රියගේ රූපාදි වූ ශ්‍රෝතස් ද ස්ත්‍රී රූපාදිය නිසා ඇති වන

තෘෂ්ණා ශ්‍රෝතස් ද පුරුෂයා ගේ චක්ෂුරාදි ද්වාර පසට ගලන්නේ ය. යමකුට සිහිනුවණ උපදවා ඒවා වළකා ගත හැකි වේ නම් ඔහු වීර්‍ය්‍යවී ඇතියෙකි. තමාගේ යහපත කර ගන්නෙකි. ධර්මයෙහි පිහිටියෙකි. දක්ෂයෙකි. නුවණැතියෙකි.